# මානවවාදී මෙන්ම පරිසරවාදී ද නොවන පරිසර දැක්මක්

පරිසර දූෂණය, පරිසර විද්‍යාව, පරිසර සංරක්ෂණය, පරිසරවේදී සංගම්, පාරිසරිකයෝ ආදිය අද පරිසරය සමගම නිතර කතාබහට ලක්වන දෑය. තමා හා තම පරිසරය වූ කලී නිශ්චිත නියාම ධර්ම අනුව ක්‍රියා කරන දෑ වන අතර ඒ පිළිබඳව වූ පූර්ණ දැනුම තම මනසට ලබාගත හැක යන මනසින්ම නිර්මාණය වූ ආකල්පය පෙරදැරි කරගෙන පෙරට ආ වත්මන් බටහිර විද්‍යාව හා එහිම ප්‍රායෝගික අංශය වූ තාක්ෂණය හේතුකොට ගෙන අද පරිසර ප්‍රශ්න පැන නැගී ඇත. විද්‍යාව හා තාක්ෂණය වශයෙන් ප්‍රධාන කොටස් දෙකක් ඇති වී ඇත්තේ ද එහිදී එම තාක්ෂණය මගින් පරිසරයට තර්ජනයක් එල්ල වී ඇත්තේද, තමා හා තමා අවට පරිසරය පිළිබඳව මිනිස් මනසේ නිර්මාණය වී ඇති මෙම ආකල්පයන් ඔස්සේ මේ විද්‍යාව හා තාක්ෂණය ක්‍රියාත්මක වන නිසාය. මිනිස් මනසටම (ඒ නිසාම මිනිසාට අවසානයේ තමාට) ප්‍රමුඛත්වය දෙමින් මිනිස් මනසේම නිර්මාණය වූ ඒ ආකල්ප සංකල්ප අවම වශයෙන් මිනිස් මනසේම නිර්මාණයක් බව මිනිසාට අමතකය (නොදනී.) මේ නිසා අද පරිසර දූෂණය වැළැක්වීමට හෝ අවම කිරීමට යැයි කලඑලි බැස ඇති විවිධාකාර වූ පරිසර විද්‍යාවන්ද එම ආකල්පයම පෙරදැරි කරගෙන බිහිවී ඇති අතර ඒ පරිසරය දූෂණය වීම පිළිබඳව වූ නිශ්චිත දැනුම තම මනසට ලබාගත හැකිය. එමගින් එය පාලනය හෝ නැවැත්විය හැකිය යන්න එම පරිසර විද්‍යාවන්ගේ ආකල්පයක් වී ඇත.

අනෙක් අතට පරිසර දූෂණය පිළිබඳව මෙන්ම, එය සංරක්ෂණය කළ යුතුය, ආදී සංකල්ප බිහිවූයේ මිනිසාගේ පැවැත්මට එමගින් තර්ජනයක් වන විටය. සියල්ල මිනිසා කේන්ද්‍ර කර ගෙන ඇත. මිනිසා (මනස) කේන්ද්‍ර කරගෙන සිදුවූ (විද්‍යාව හා තාක්ෂණය හරහා) ක්‍රියාවලියක මිනිසා කේන්ද්‍ර කරගෙනම ඇති වූ අනිටු ප්‍රතිඵල පාලනය කිරීමට හෝ නැවැත්වීමට නැවත මිනිසා කේන්ද්‍ර කරගෙන ක්‍රමෝපායන් පිළියෙල වේ. මෙම මානව කේන්ද්‍රීය (මනසට සියල්ල දත හැකිය ආදී වූ) විද්‍යාව - තාක්ෂණය ආදියෙන් පරිසරය ජය ගැනීමට යත්න දැරූ මිනිසා එමගින් ඇති වූ පරිසර දූෂණයද එකී පරිසරය ජයගැනීම නම් වූ ආකල්පය තුළම ජය ගැනීමට උත්සාහ ගනී.

මේ අනුව සියළු සතුන් ගහ කොළ ඇතුළු සමස්ථ පරිසරයේම පැවැත්ම කෙලෙසක විය යුතුද යන්න තීරණය වන්නේ ඉන් මිනිසාට ඇතිවන බලපෑම මතය. ගහකොළ පැවතිය යුත්තේ මිනිසාට අවශ්‍ය වාතය පිරිසිදු කිරීමට, අවශ්‍ය ජලය (වර්ෂාව මගින්) ලබාදීමට ආදී වශයෙනි. සතුන් පිළිබඳවද එසේය. මේ සියල්ලේ පැවැත්ම අවසානයේ මිනිසාගේ යහ පැවැත්මට සබැඳිය. ඉහත කී පරිදි ජෛවීයව හෝ වෙනයම් ආකාරයකට සෘජුවම මිනිසාට ප්‍රයෝජනයක් නොමැති ශාඛ වර්ග හා සතුන් ජිවත්විය යුත්තේ එමගින් මිනිසාට සොබා සෞන්දර්ය නමැති වින්දනය ලබා ගැනීමටය. අභයභූමි, රක්ෂිත වනාන්තර, සත්වෝද්‍යාන ආදිය අද බොහෝ විට ඇති වන්නේ එම ආකල්පය තුළය. අද බොහෝ නිවෙස් තුළද මෙලෙස කෘතිමව හෝ ස්වභාවික පරිසරය ඇති කරගෙන ඇත. ස්වභාවිකත්වය එලෙසම ගැනීමට අද මිනිසා සූදානම් නැත. ඒ සඳහාද තම (මනසේ) ආධිපත්‍ය, අණසක පතුරුවා ස්වාමිත්වය තමන් සතු කරගනී. මිනිසා ස්වභාවිකත්වය අර්ථවත් කරන්නේ එම ආකල්පය තුළය. එය සැබැවින්ම කෘතිම ස්වභාවිකත්වයකි.

මෙසේ මෙම මානව කේන්ද්‍රීය වූ පරිසර සංරක්ෂණයද පදනම් වී ඇත්තේ පරිසරය තේරුම්ගෙන එය මෙල්ල කරගෙන එය දූෂණයවීම වැළැක්වීම හෝ පාලනය කිරීම මතය. පරිසර දූෂණය පාලනය කිරීමට හෝ වැළැක්වීමට උපයෝගි කර ගන්නා විද්‍යා - තාක්ෂණ උපක්‍රමද අවසානයේ (බොහෝවිට) පරිසර දූෂණයටම දායක වන්නේ මේ නිසාය. මිනිසා පරිසරයේ ස්වාමිත්වය තමනට ගත හැකිය යන ආකල්පය තුළ හිඳිමින් ක්‍රියාකරන තුරු මේ පරිසර ප්‍රශ්න විසඳිය හැකි නොවේ. එම ආකල්පයෙන් නොමිදී එම ආකල්පය තුළම වූ ක්‍රමෝපායන් උපයෝගී කරගෙන පරිසරය සංරක්ෂණය කිරීමට යෑම හොරාගේ අම්මාගෙන් පේන ඇසීමකි. අපට පාලනය කරමින් ස්වාමිත්වය දැරිය හැක්කේ පූර්ණ වශයෙන් අපෙන් පරිබාහිරව පවත්නා දෙයක් සම්බන්ධයෙනි, එහෙත් පරිසරය, ලෝකය එසේද? බුදුන් දෙසා ඇත්තේ ලෝකය දෙස බලත්ම තමන් පෙනෙන බවත් තමා දෙස බලත්ම ලෝකය පෙනෙන බවත්ය.

මිනිසාට අනෙක් සතුන්ට වඩා දියුණු වූ මනසක් ඇතිය යන්න සාමාන්‍යයෙන් අවට පරිසරයේ අනෙක් සතුන් හා මිනිසා සසඳා බැලීමේදී මිනිසා එම අත්දැකීම් පැහැදිලි කර ගැනීමට ඉවහල් කර ගන්නාවූ සාමාන්‍ය හොඳ සංගත ආකෘතියකි. එලෙසම මෙම දියුණු මනස නමැති ආකෘතිය තුළ හිඳිමින් ( එය ආකෘතියක් බැව් නොදැන) තව තවත් ආකෘති ගොඩනගමින් එවා අනුව ක්‍රියා කරමින් තමාද පරිසරයද වෙනසීමේ මෙන්ම මෙම මනස තේරුම් ගැනීම මගින් සියල්ල ආකෘති (සම්මුති) ලෙස පමණක් ගනිමින් උත්තරීතර තත්ත්වයට පත්වීමේ ශක්‍යතාවයද මේ මනස සතුය. නිවන ප්‍රධාන වශයෙන් අවශ්‍ය වන්නේද, එය ප්‍රත්‍යක්ෂ කර ගැනීමට හැකියාව ඇත්තේද මේ දියුණු වූ මිනිස් මනසටමය.

මිනිස් මනස උසස්ය යන්න වඩා හොඳින් අර්ථවත් වන්නේ එම මනසේම ගොඩ නැගෙන පරිසරය තේරුම් ගැනීම, එය ජය ගැනීම, පරිසරය පාලනය කරමින් එහි ස්වාමිත්වය දැරීම ආදී වූ සංකල්ප ආකෘති වැනසීමේ හැකියාවද මනස සතුය. යන්න තුළය. එසේ නොමැතිව තමා හා අවට සියල්ල (විශ්වය-ලෝකය) තේරුම් ගැනීමේ හැකියාවක් මනස සතුය යන ආකල්පය නිසා නම් නොවේ. තමා හා අවට පරිසරය යථාර්තවාදීව තේරුම් ගැනීම යන්න මනෝවිකාරයකි. සැබැවින්ම තමා හා අවට පරිසරය තේරුම් ගැනීම වූ කලි මේ විකාරය තේරුම් ගැනීමය. මිනිසා කළ යුත්තේ තමා හා තම අවට පරිසරයේ විවිධාකාරවූ සංසිද්ධීන් අරභයා තමාට අවශ්‍ය පරිදි ඒවා සංගත වන පරිදි ආකෘති ගොඩනගාගෙන (මෙහිදී තමන්ට අවශ්‍ය පරිදි/ ගොඩනගන ආකෘති වූ කලී පරිසයේ ඇති නියාම ධර්ම පිළිබඳව යථාර්ථවාදී තේරුම් ගැනීමක් පිළිබඳ කතාවක් නොවේ. ඒ නිසාම එහිදී පරිසරය ජය ගැනීම වැනි ආකල්පයන්ද නැත) ඒවා අනුව තම වැඩ කටයුතු කරගෙන යෑමයි. හිරු, සඳ, නැගීම බැසීම දේශගුණය කාලගුණය වෙනස්වීම්, සුළං හැමීම, ශාඛ පැලවීම, සතුන්ගේ හැසිරීම් රටා ආදියේ ඇති රටා දැනගෙන එදිනෙදා ජීවිකාව ගෙන යා හැක. මේවා ස්වභාවික රටාය.

එහෙත් මේ රටා පිටුපස අපේ මනසට තේරුම් ගත හැකි යම් "නිශ්චිත නියාම" ධර්ම කීපයක් ඇත; යනුවෙන් සිතා ගෙන ඒවා සොයා යමින් එම නියාම ධර්ම අල්ලාගෙන ස්වභාවික රටා අපට අවශ්‍ය පරිදි, අපේ ස්වාමිත්වය තුළ ක්‍රියා කර ගැනීමට යෑමේදී ව්‍යාකූල තත්වයක් ඇති වේ. අද විද්‍යාව මගින් මේ "නිශ්චිත නියාම" ධර්ම තේරුම් ගැනීමට උත්සාහ ගැනෙන අතර එම සිද්ධාන්ත උපයෝගී කරගෙන තාක්ෂණය ක්‍රියාත්මක වීමෙන්, එනම් ස්වභාවික රටා මිනිසාට අවශ්‍ය පරිදි සකසා ගැනීම සංවර්ධනය ලෙස හැඳින්වේ. මේ සංවර්ධනය මගින් මිනිස් දිවිය පූර්ණ සැපවත් භාවයකට පත් කරන බවද පැවසේ. එහෙත් මිනිස් දිවිය පූර්ණ සැපවත් වීම යනු කුමක්ද? විද්‍යාව මගින් සියල්ල සොයා ගෙන සිද්ධාන්තකරණය තුළ මනස පූර්ණත්වයට පත්වීම සහ එම නිශ්චිත සිද්ධාන්ත ඔස්සේ තාක්ෂණය ක්‍රියාකාරී වීමෙන් මිනිස් ශරීරය පූර්ණ සැපවත් භාවයට පත් වනවා යන මනසේම නිර්මාණය වූ ආකල්පයයි. බටහිර මිනිසුන්ගේ මනසේ උපන් මේ ආකල්ප තුළ ක්‍රියාත්මක වීමෙන් (එනම් මිනිස් මනස හා සිරුර පූර්ණත්වයට පත් කිරීම) හටගත් පරිසර ප්‍රශ්න නැති කිරීමටද මේ ආකල්පම උපයෝගි කර ගැනීම විහිළුවකි.

මේ ආකල්ප මත රැඳුන සංවර්ධන රාමුව තුළ පරිසරය රැකිය නොහැකිය. පරිසර දූෂණය සහ සංවර්ධනය දෙකක් ලෙස ගත නොහැකිය. මේවා එකම කාසියේ දෙපැත්තය. පරිසර දූෂණය වැළැක්වීම හෝ පාලනය කිරීම කළ හැකි නම් සංවර්ධනය යහපත්ය, වැනි ප්‍රකාශ අර්ථ විරහිතය. පරිසර දූෂණය හා මේ සංවර්ධනය අතරේ මැද පිළිවෙතක් නැත. පරිසර මිතුරු සංවර්ධනයක් (පෙර කී ආකල්ප සහිත) නැත. මිනිසාට හා පරිසරයට තවදුරටත් පැවතිය යුතු නම් මේ සංවර්ධන රාමුව කඩා බිඳ දැමිය යුතුය. පරිසර දූෂණය යනු සංවර්ධනයේ ප්‍රතිඵලයක් නොවේ. සංවර්ධනය තුළින්ම පරිසර දූෂණය වේ.

ඉතින් දැන් කළ යුත්තේ පරිසරය හා සහජීවනය තහවුරු කෙරෙන සංවර්ධනයක් කරා පිය නැගීමය. මින් අදහස් වන්නේ මිනිසා ස්වභාවික පරිසරය තුළ එලෙසම ජීවත් විය යුතුය යන්න නොවේ. සැබැවින්ම මිනිසාට එලෙස ජීවත්විය හැකියද යන්න ප්‍රශ්නයකි. මිනිසාට තම මනස උපයෝගි කරගෙන ස්වභාවික පරිසරය වෙනස් කරගෙන (අනෙක් සතුන්ට වඩා) ජීවත් වීමට සිදුවේ. එහෙත් එය ස්වභාවිකත්වයේ සීමාව නොඉක්මවිය යුතුය. (ස්වභාවිකත්වයේ සීමාව යන්න ලිපියකින් විස්තර කල හැක්කක් නොවේ. එසේ වුවහොත් එය නැවත ස්වභාවික පරිසරය සෛද්ධාන්තීකරණය තුළ වත්මන් බටහිර විද්‍යාව මුහුණ දෙන අර්බුදයට ලක්වීමක් වනු ඇත.) මෙවැනි සංවර්ධනයක් උදෙසා අවශ්‍ය තාක්ෂණය ගොඩනගා ගත හැක්කේ පරිසරයෙන් ලැබෙන පරිචයෙන්මය. මෙහිදී තමා හා පරිසරය පිළිබඳව වන මිනිසාගේ ආකල්ප වෙනස් විය යුතුය. එය මානව කේන්ද්‍රීයභාවයෙන් මිදිය යුතුය. මේ මිහිතලය මිනිසාගේ පමණක් නොව එහි තමන්ගේ යහ පැවැත්ම තහවුරු කර ගැනීමට සෑම සතෙකුටම මෙන්ම ගහ කොළවලටද අයිතියක් ඇතිය වැනි ආකල්පයක් අප ඇති කර ගත යුතුය.

බුදු දහමේ නොමඳ ආභාෂය ලද සංස්කෘතියකට හිමිකම් කියන අපට මෙය එතරම් අසීරු කරුණක් නොවේ. පරිසරය ජය ගැනීම තුළ අර්ථවත් වන්නාවූ සංවර්ධනයක් බුදු දහමේ නැත. එහි ඇත්තේ තමා ජය ගැනීම පිළිබඳ සංවර්ධනයකි. තමා ජය ගැනීමට එනම් තම මමත්වය, තණ්හාව ආදිය පරාජය කිරීමට උත්සාහ ගන්නා විට පරිසරය ජය ගැනීමේ (තේරුම්ගැනීමේ) නිරර්තකභාවය මොනවට පැහැදිලිවේ. පරිසරය ජය ගැනීම පසෙකලූ තමා ජය ගැනීම (නිවන් දැකීම) උදෙසා වූ එසේම ඒ සඳහා පරිසරයේ ජීවත්වීම් සඳහා අවශ්‍ය වූ සැබෑ පරිසර හිතකාමී ආර්ථික සංවර්ධන රාමුවක් මෙවිට ගොඩනැගේ.

පරිසරය ඇත්තේ මිනිසා වෙනුවෙන්ය. එය දූෂණය වීමෙන් වලක්වාගත යුතතේද මිනිසාගේ යහපැවැත්ම වෙනුවෙන් ආදී වශයෙන් වූ මානව කේන්ද්‍රීය වූ ආකල්පයෙන් මෙන්ම මිනිසාගේ කිසිදු බලපෑමකට ලක් නොවී පරිසරය එලෙසම තිබිය යුතුය යන පරිසර කේන්ද්‍රීය වූ දැඩි පරිසරය වාදයෙන්ද අප මිදිය යුතුය. අපේ පරිසර දැක්ම මේ අන්ත දෙකේ මිශ්‍රණයක් නොවිය යුතුය. මේ මහ පොළව (පරිසරය) මිනිසාට පමණක් නොව සියලු සතා

සීපාවාටද අයිතිය වැනි අදහසක් සමගම මේ මැදුම් පිළිවෙත (එනම් පෙරකී අන්ත දෙකෙන්ම මිදීම) බෞද්ධ සාහිත්‍ය තුළද දැකිය හැකිය. නිකරුණේ ගසකින් කොළයක් කැඩීම පවා නොකළ යුතු බව බුදුන් වහන්සේ විසින් දේශනා කර ඇත.

අද තහවුරු කළ යුත්තේ පරිසරය සමග සහජීවනාත්මක පැවැත්මය. පරිසරය විශ්ලේෂණය කරමින් තේරුම් ගැනීමට යෑම තුළ මෙය කළ නොහැකිය. වත්මන් සත්ව/ශාක ගොවිපලවල ස්වභාවයත් පැරණි ගැමියන් එවැනි කටයුතු කළ ආකාරයත් සැසඳීමේදී අද අප පරිසරය සමග සහජීවනය යන්නෙන් කොපමණ ඈත්වී ඇත්දැයි තේරුම් ගත හැකිය. අද සතුන් හා ශාක ඇති කරන්නේ එවායේ සියළු ක්‍රියාකාරිත්වයන් දැනගෙන (රසායනික, ජෛව විද්‍යාත්මක ආකෘති තුළ) ඒවායෙන් උපරිම ඵලදාවක් ලබා ගැනීමට සිතාගෙනය. ඒවා හුදෙක් අපෙන් පරිබාහිරව පවත්නා ජෛව රසායණික ක්‍රියාවලින් පමණය. ඵලදාව උපරිම වශයෙන් ලබාදෙන කාලය ඉක්මවූ පසු ඊළඟට ඵලදාව උපරිම කර ගැනීම සඳහා සතුන් මරා මස් කිරීම සිදුවේ. එහෙත් එදා අපේ ගැමියාගේ තත්වය කුමක්ද? ඔහු සතුන් ශාඛ ඔහුට උපරිම ඵලදාව ලබාදීමට සැදී පැහැදී සිටින දෑ ලෙස දුටුවේ නැත. ඒවා යන්ත්‍ර ලෙස සලකා උපරිම ඵල ප්‍රයෝජන ලබාගැනීමට ගියේ නැත. ගැමියා ශාඛ හා සතුන්ට දැක්වූයේ භක්ත්‍යාදරයකි. එය ජීව භක්තිවාදය ලෙස සැලකිය හැක. සතුන්ගෙන් හා ශාක වලින් ලැබෙන ඵල ප්‍රයෝජන හරහා ශාක හා සතුන් දෙස බැලීමක්ද නොවීය. කෙටියෙන් කියනවානම් එදා අපේ ගැමියා පරිසරය කෙරේ දැක්වූයේද යම් ආකාරයකින් තම මවට දක්වනවා වැනි සැලකිල්ලකි. පරිසරය අනවශ්‍ය පරිදි විශ්ලේෂණය කර විවිධ ජෛව රසායණික ආකෘති තුළ පහදා ගැනීමට යෑම තුළ පරිසරය කෙරෙහි මිනිසාගේ පවතින භක්ත්‍යාදරය හීන වී, පරිසරයද තමන් විසින් නිපැදූ යන්ත්‍රයක තත්ත්වයට පත්වේ. අපි අපේ අම්මාගේ ක්‍රියාකාරිත්වය එනම් ඇගෙන් ලැබෙන ආදර කරුණාව ආදිය ඇගේ සිරුරේ නිව්රෝන, රසායණික ද්‍රව්‍ය ආදිය ඇතුළත් ජෛව රසායණික ආකෘතියක් තුළ පැහැදිලි කර ගැනීමට ගියේ යැයි සිතමු. දැන් මවගේ ආදරය වු කලි හුදෙක් කිසියම් ජෛව රසායණික ක්‍රියාවලියක ප්‍රථිඵල පමණක් වනු ඇත. දැන් අපට අම්මා කෙරෙහි පෙර පැවති ආදරය ඇති කරගත හැකිද? පරිසරය සම්බන්ධයෙන් යම් යම් ආකෘති තුළ ක්‍රියාත්මක වීමට සිදු වුවද සියලූ සතුන් ගහකොළ සම්බන්ධයෙන් අප ඇති කර ගත යුත්තේ මව පිළිබඳව ඇති ආකල්පය වැන්නකි.

මානවවාදී ආකෘතියෙන් මිදී සියළු සතුන් හා ගහකොළද ඇතුලත් වාදයක් ඇති කර ගත යුතුය. සියලු සතුන් හා පරිසරයද ජෛව රසායණික ආකෘති තුළ ( ඒවා ආකෘති බැව් පවා නොදැන) පහදා දෙමින් ඒවායෙන් මිනිසාට (මානව වාදය තුළ) උපරිම ඵල ප්‍රයෝජන ලබාදීමට තතනන උදවියගෙන් අවසානයේ සැබෑ මානව වාදයක්ද බලාපොරොත්තු විය නොහැකිය. ඔවුන් මිනිසුන් හා සබැඳි ක්‍රියාකාරකම් පමණක් මානව දයාව, ආදරය වැනි හැඟීම් මත තේරුම් ගන්නේ කෙසේද? සතෙකුගෙන් යන්ත්‍රයක් ලෙස සලකමින් උපරිම ඵලප්‍රයෝජන උපරිම කාර්යක්ෂමතාවෙන් (ඔවුන්ගේම අර්ථදැක්වීම් වලට අනුව) ලබා ගැනීමට උත්සාහ ගන්නා තැනැත්තා තම මව්පිය නෑ හිතවතුන් හා පොදුවේ අනෙක් මිනිසුන් සම්බන්ධයෙන් පමණක් එවැනි ආකල්පයකින් මිදෙන්නේ කෙසේද? මානව වාදය කෙලවර වනු ඇත්තේ පුද්ගලවාදයෙහි දැඩි මමත්වය තුළය. සියළු සතුන් හා ශාක ඇතුලත් සමස්ථ පරිසරයෙන්ම උපරිම ඵල ප්‍රයෝජන ලබා ගනිමින් තම වර්ගයා එනම් මිනිසා සැනසීමට තතනන මිනිසා අවසානයේ සියළු සතුන් ශාක ඇතුළත් සමස්ථ පරිසරය පමණක් නොව අනෙක් මිනිසුන් ද තමගේම උපරිම ඵල ප්‍රයෝජනය සඳහා යොදා ගැනීම වලක්වා ගන්නේ කෙසේද?

අද කිසියම් සංවර්ධන (පෙරකී ආකල්ප සහිත) ව්‍යාපෘතියක් ඇරඹීමට පෙර එමගින් පරිසරයට වන හානියද සලකා බලා, එම ව්‍යාපෘතියෙන් වන සෙත සමග එය සසඳා බැලේ. එහෙත් මෙහිදී පරිසරය පිළිබඳව කෙරෙන ඇගැයීම් සඳහා වන නිර්ණායකද අවසානයේ වත්මන් සංවර්ධනයේම ආකල්ප තුළම කොටුවූ දෑය. උදාහරණයක් ලෙස යම් දිය ඇල්ලක් හරහා වේල්ලක් බැඳ ජල විදුලි බලාගාරයක් පිහිටුවීමක් සලකා බලමු. මෙහිදී මෙම දියඇල්ල පහළ කොටස යම් ප්‍රමාණයකින් සිදී යාමකට ලක්වන නිසා, ඉන් ජලය ලැබූ වගාවනට වන හානිය, ස්වභාවික සෞන්දර්යයට වන හානිය (සොබාවික සෞන්දර්යයට වන හානිය මුදලට පෙරලෙන්නේ එය නැරඹීමට අයකරගන්නා මුදල් ඇසුරෙනි.) වැනිදෑ මුදල් වටිනාකම් බවට පෙරලා එම අගය හා එම විදුලි බලය නිපදවීමෙන් ලැබෙන ආදායම සලකා බැලේ. මේ සැසඳීම කෙතරම් අර්ථවත්ද? මේ අනුව අපට අපේ දෙමාපියන්ගේ ක්‍රියාකාරකම් වලින් වන බලපෑමද සැලකිල්ලට ගෙන ඒවා මුදල් බවට පෙරලා එසේම ඔවුන් වෙනුවෙන් වැයවෙන මුදලද ගණනය කර ඔවුන් යම් වයස් සීමාවකින් පසුව ජීවත්වීම සුදුසු නැති ලෙස තීරණය කල හැකි නොවේද? විදුලි බලාගාරය ඉදිකිරීම හෝ නොකිරීම හා දෙමාපියන් ජීවත් කරවීම හෝ නොකරවීම එක එල්ලේ සැසඳිය නොහැකි බව සැබෑය. එහෙත් මේ දෙකම පිටුපස ඇත්තේ එකම ආකල්පයයි. අද දිය ඇල්ලේ තත්ත්වයට හෙට දෙමාපියන් පත්වීමට බැරි නැත. මේ සංවර්ධනය යොමු වී ඇත්තේ එවන් දෙසකටය. මේ සංවර්ධන රාමුව තුළ හිඳිමින් පරිසර දූෂණයද එම රාමුව තුළම අර්ථවත් කරමින් කිසිදා මේ අර්බුදයෙන් ගැලවිය නොහැක.

***වරලත් ඉංජිනේරු කපිල පීරිස්***
***ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය***